කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2011/2012

2014 අප්‍රේල්/මැයි/ජූනි

මානව ශාස්ත්‍ර පීඨය

නාට්‍ය හා රංග කලාව - DMAT E3015

නූතන යුරෝපීය හා ඇමරිකානු නාට්‍ය කලාව

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි. කාලය : පැය 03 යි.

---

1. දහනව වැනි සියවසේ දී යථාර්ථවාදී නාට්‍ය සම්ප්‍රදාය බිහිවීමෙහි ලා සමාජීය, බුද්ධිමය හා තාක්ෂණික ජයග්‍රහණ කෙතෙක් දුරට ඉවහල් වී දැයි විමසන්න.

2. හෙන්රික් ඉබ්සන්ගේ "සෙල්ලම් ගෙදර" (A Doll's House) නාට්‍යයේ සෑම චරිතයක් ම කිසියම් සාධාරණත්වයක් අපේක්ෂා කරයි. විමසන්න.

3. "චෙකොව්ගේ නාට්‍යවල සුවිශේෂත්වය නම්, එදිනෙදා ජීවිතයේ හමුවන චරිත පාදක කොට මතු කරන යථාර්ථවාදී ජීවන දෘෂ්ටියයි." චෙරි උයන (Cherry Orchard) ඇසුරින් විමසන්න.

4. "නළුවාගේ කාර්යය වූ කලී රඟපෑම නොව කිසියම් චරිතයක් තුළ ජීවත් වීමයි." යන ස්ටැනිස්ලව්ස්කිගේ අදහස විග්‍රහ කරන්න.

5. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් ගේ එපික් රංග රීතිය (Epic Theatre) ඇරිස්ටෝටලියානු සුසාදිත නාට්‍ය (Well Made Play) රීතියෙන් වෙනස් වන ආකාරය හුණුවටයේ කතාව නාට්‍ය ඇසුරින් විමසන්න.

6. එක්කෝ

(අ). අසම්මත හෙවත් න්‍යාය විරෝධී නාට්‍ය සම්ප්‍රදාය බිහිවීමට බලපෑ සමාජ, දේශපාලන පසුබිම විස්තර කරන්න.

නැතිනම්

(ආ). තර්කානුකූල සම්බන්ධයක් නොපෙනෙන අවස්ථාවන් සමග සිය චරිත මුණගැස්වීමට සලස්වා මිනිස් ජීවිතයේ පරමාර්ථ රහිත තනිකම නිරූපණය කිරීම "ගොඩො උන්නැහේ එනකං" (Waiting for Godot) නාට්‍යයේ අරමුණ වේ. විමසන්න.

7. ඇමරිකානු නාට්‍ය රචකයින් කෙරෙහි බලපෑ යුරෝපීය නාට්‍ය රචකයින් පිළිබඳ නිදසුන් සහිත විග්‍රහයක් කරන්න.

8. තෝර්ටන් වයිල්ඩර්ගේ නාට්‍ය විලාසයේ ඇති සුවිශේෂත්වය "හිරු දහස" (Our Town) නාට්‍ය ඇසුරින් විමසන්න.

9. නූතන ඇමරිකානු පහළ මධ්‍යම පංතියේ බේදාන්තමය පැවැත්ම ගැඹුරින් විග්‍රහ කිරීමට ටෙනසි විලියම්ස් ගත් උත්සාහය "පුංචි පළිඟු රූත" (Glass Menagerie) ඇසුරින් පැහැදිලි කරන්න.

10.පහත සඳහන් මාතෘකා අතරින් දෙකක් තෝරාගෙන තුලනාත්මක විග්‍රහයක් කරන්න.

01. කුරිරු රංගය
02. දිළිඳු රංගය
03. ස්වාභාවිකවාදය
04. සංකේතවාදය
05. අසම්මත නාට්‍ය

**************************